# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 23 දරන මට්ටු ඇල්ලීම සහ සූදු මඩු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 ජූලි මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 අගෝස්තු මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 5.50 යි.** තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

## 2003 අංක 23 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2003 ජූලි මස 30 වන දින.]

එල්. ඩී.– ඕ. 62/2002.

### 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2003 අංක 23 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ 7 වන වගන්තියේ "සූදු" යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි "චිංග්-එට්-උම්, චීල් ඔෆ් ෆෝචූන්" යන වචන වෙනුවට "චිංග්-එට්-උම්, රූජිනෝ හෝ වීල් ඔෆ් ෆෝචූන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 1988 අංක 40 දරන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. 2002 අංක 11 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ උපලේඛනයෙහි I වන කොටසේ "රුපියල් පන්ලක්ෂයක්" යන වචන වෙනුවට "රුපියල් තිස් දහසක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ උපලේඛනයෙහි II වන කොටස ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"II වන කොටස

මෙහි I වන තීරුවෙහි නිශ්චිතව සඳහන් සෑම වර්ෂයක් සඳහා ම යම් තැනැත්තකු ගෙවනු ලැබිය යුතු බද්ද, මෙහි නිශ්චිතව II වන තීරුවෙහි අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් මුදල හා සමාන මුදලක් විය යුතු ය—

2–H 020435-1,000 (2004/02)

(අ) සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සදහා -

| I වන තීරුව වර්ෂය | II වන තීරුව බදු මුදල |
|---|---|
| 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් ම සදහා | රුපියල් මිලියන එකයි ; |
| 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂය සදහා | රුපියල් මිලියන විසිපහයි ; |

(ආ) (රූජිනෝ ක්‍රීඩාව කිරීම හැර) සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සදහා -

| | |
|---|---|
| 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සෑම වර්ෂයක් ම සදහා | රුපියල් මිලියන දොළහයි ; |

(ඇ) රූජිනෝ ක්‍රීඩාව පමණක් ක්‍රීඩා කිරීමෙන් ව්‍යාපාරය පවත්වාගෙන යාම සදහා -

| | |
|---|---|
| 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සෑම වර්ෂයක් ම සදහා | රුපියල් පන්ලක්ෂයයි. |

ආපසු ගෙවීම.

**4.** 2002 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ව ආරම්භ වන වර්ෂය සදහා ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ බදු ගෙවීමට යටත්ව සිටි යම් තැනැත්තකු විසින් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනයට පෙරාතුව කොමසාරිස් ජනරාල්වරයා වෙත ඒ බදු මුදල ගෙවනු ලබන අවස්ථාවක, තත් කාර්ය සදහා කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති බද්දට වැඩියෙන් ගෙවන ලද මුදල ආපසු ලබා ගැනීමට ඒ තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය.

වගකීමෙන් නිදහස් කිරීම.

**5.** 2002 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන වර්ෂය සදහා, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ බදු ගෙවීමට යටත්ව සිටි යම් තැනැත්තකු විසින්, මේ පනත ක්‍රියාත්මක වීම

ආරම්භ වන දිනයේ දී ඒ බදු මුදල ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, මේ පනත යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි අය විය යුතු බදු මුදල ඒ තැනැත්තා විසින් ගෙවනු ලබන්නේ නම්, එම පනතේ විධිවිධාන ඒ තැනැත්තා විසින් කඩ කර ඇති බවට සලකනු නොලැබිය යුතු ය.

**6.** මේ පනත මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන, සියලු කාර්යයන් සඳහා 2002 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. අතීතයට බලපෑම.

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.